නැවතත් ඔබේ ප්‍රශ්නයට යොමුවුණොත්, බටහිර නිර්මාණ ලෝකය සහ අපේ සිනමාව අතර මා දකින ප්‍රබලම වෙනස වන්නේ සම්පත් පරතරයයි. අපේ රටේ ඉතාම දක්ෂ නිර්මාණකරුවන් සිටිනවා. නමුත් නිර්මාණයක් බිහිකිරීමේදී නිෂ්පාදන පිරිවැය සහ යටිතල පහසුකම් සම්පාදනය කරගැනීමේදී ඔවුන් උග්‍ර අර්බුද වලට මුහුණ පානවා. ඒ සම්පත් හිඟය නිර්මාණකරුවන් අධෛර්යමත් වීමට ප්‍රබල හේතුවක්. කර්මාන්තයක් ලෙස සිනමාව ගොඩනැගී නැති කම තුල දක්ෂ නිර්මාණකරුවන් වෙනත් වෘත්තීන් වෙත ඇදීයෑම නොවැලැක්විය හැකි කරුණක්. මා බටහිර සිනමාකර්මාන්තය තුල වෘත්තීය සුරක්ෂිතභාවය ඉතාම හොඳින් දුටුවා. එක නිර්මාණයක් අවසන් වෙද්දි තවත් නිර්මාණයක කොන්තරාත්තුව ඔවුන් අතට පත් වෙනවා. ඒ ස්ථාවරභාවය තුල ඔවුන් නිර්මාණරුවන් ලෙස තෘප්තිමත්. එය අනවරථ නිර්මාණකරණ කාර්යාවලියක නිරත වීමට ඔවුන්ට ලැබෙන විශාල පිටුබලයක්.

අනෙක් කාරණය වන්නේ ශිල්පීන්ගේ වෘත්තීමයභාවයයි. නළු නිළියන්ගේ පටන් ආලෝකකරණ ලාම්පුව භාරව සිටින්නන් දක්වා සියල්ලන්ම පාහේ තමන් නියැලෙන කාර්යය වෘත්තීමයභාවයකින් සිදුකරනවා. ඔවුන් ඉතාම වගකීම් සහගත පිරිසක් ලෙස මට හැඟුණා. තමන් වෙත පැවරුණු කාර්යය උපරිමයෙන් ඉටුකිරීමේ මෙහෙයවීම මා ඔවුන් තුළ පැහැදිලිව දුටු ලක්ෂණයක්. එයත් මා උක්ත කී දියුණු සහ ස්ථාවර සිනමා කර්මාන්තයක් තබීමේ ප්‍රතිඵලයක් විය හැකියි.
තවත් දෙයක් තමයි එම නිෂ්පාදන කණ්ඩායමේ තරුණ තරුණියන් තුළින් මා දුටු ජීවන අනුරාගය ඔවුන් ඉතාමෙ උද්යෝගිමත් සහ කාර්යක්ෂම පිරිසක්. සිනමා කර්මාන්තය පිළබිඳව පවතින නොතිත් ආශාව නිසාම එම කේෂ්ත්‍රයට පැමිණි ඔවුන් තුල කර්මාන්තය පිළබිඳව පැහැදිලි අවබෝධයක් තබුණා. මා රූපගත කිරීම් පවතින දර්ශන තලයට කැඳවා ගෙන යෑමට පැමිණි රියැදුරා තුළ පවා ලෝක සිනමාව, තිර පිටපත් රචනය, අධ්‍යක්ෂකවරුන් සහ රංගනවේදීන් පිළබිඳව පුදුම අවබෝධයක් සහ දැනුමක් තිබුණා.
ඒ වගේම සොබාදහම, ඉතිහාසය, දේශපාලනය සහ තාක්ෂණය වැනි හැම කරුණක් පිළබිඳවම ඔවුන් තුල විශාල උනන්දුවක් පවතිනවා. ඒ තමයි අර අනුරාගයෙන් ඇලලුණු ශිල්පීන්. එය අපේ රටේ අය තුළ නැතුවා නොවේ. සීමිතයි. කෙසේ වෙතත් දැනුම සොයා යෑමේ රුචියෙන් මඩිනු ලැබූ මනසක් තිබීමම අතිශය සුන්දර කාරණයක් ලෙස මට දැනෙනවා.

Jude Law, Diane Keaton වැනි හොලිවුඩයේ ඉහළම පෙළේ නළු නිළියන් මට එතැනදී හමුවුණා. ඔවුන් වෘත්තීමය වශයෙන් කෙතරම් ඉහළ තලයක සිටියත් බොහොම නිහතමානී හෘදයාංගම මනුෂ්‍යයන්. ඔවුන් ලංකාව වැනි කුඩා සිනමා කර්මාන්තයක් පවතින රටකින් පැමිණි මා වැනි ක්ෂුද්‍ර නිළියකට පවා ප්‍රශංසනීය වටිනාකමකින් සැලකුවා.

ඔවුන් අතරේ මට කිසිදු ආගන්තුක බවක් දැනුනේ නැහැ. ඔවුන් රංගනය යන විෂයය පථය පිළබිඳව කෙතරම් පෘථුල ලෙස සිතනවාද ඒ ගැන කෙතරම් සංවේදීද යන කාරණය මවිසින් අත්දැක්කා. තම රංගනය වෙනුවෙන් ඔවුන් දරන මහන්සිය සහ ඒ පිළිබඳව ඔවුන් කෙතරම් බැරෑරුම්ව සිතනවාද යන කාරණය මා විශ්මයට පත් කළා. ඔවුන් තමන්ට ලැබෙන සෑම අවස්ථාවක්ම උපරිමයෙන්ම භාවිතා කරන පිරිසක්. රූ ගත කිරීම් ආරම්භ කිරී මට පෙර ස්වයං අභ්‍යාස වල ඔවුන් කිහිප වරක් යෙදෙමින් ඉතා හොඳ පෙර පුහුණුවක් අත් කරගන්නවා පමණක් නොවේ ඉතාම සියුම් කාරණා පිළබිඳව අධ්‍යක්ෂකවරයා සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනවා.

ඒ හැරුණු කොට මා වඩාත් සතුටට පත් කළ කාරණය වන්නේ තම සහාය නළු නිළියන් සමඟ ඔවුන් පවත්වාගෙන යන ඉතා හොඳ සම්බන්ධතාවයි. බටහිර චිත්‍රපට වල දකින ඔවුන්ගේ රංගනය අප වසඟයට පත් කරවන්නේ ඔය කියන සියළු කාරණා වල පොදු සාධකය හැටියට යැයි මට දැන් වැටහෙනවා. මා උක්ත සඳහන් කළ සියළුම කාරණා වලට ප්‍රබලම උදාහරණය ලෙස මා මතුකරන්න කැමතියි , තරුණ පාප්වහන්සේ ලෙස රංගනයේ යෙදුණු Jude law තමන්ගේ චරිතයට අදාළ දේශපාලන ආගමික ඉතිහාසය පිළබිඳව ගැඹුරින් අධ්‍යයනය කර තබුණු බව මට පැහැදිලි වීම යන කාරණය. Paolo Sorrentino පිළබදවත් මා යමක් මෙහිදී මතුකළ යුතුයි. ඔහු විශිෂ්ට ගනයේ පිටපත් රචකයකු මෙන්ම අධ්‍යක්ෂකවරයකු ලෙස මා දුටුවා. The Young Pope නිෂ්පාදනය නැරඹූ අයෙකුට ඔහු පිළබඳව මවිත නොවී සිටිය නොහැකි බව මගේ පෞද්ගලික විශ්වාසයයි. ඔහුගේ එම නිර්හිත විශිෂ්ට නිර්මාණයට සුළුවෙන් හෝ දායක වන්නට ලැබීම නිළියක් ලෙස මගේ වෘත්තීය ජීවිතයේ මා ලැබූ විශාල භාග්‍යයක්. නිළියක් ලෙස පැහැදිළි දැක්මක් සහිත ගමනක යෙදෙන්නට අවශ්‍ය අමුද්‍රව්‍ය රැසක් මට ඔවුන් සමඟ වැඩ කිරීමෙන් සපයා ගත හැකි වුණා යැයි කීමත් වඩාත් නිවැරදියි.

**මෑතකදී නිමාව දුටු ආනන්ද අබේනායකයන්ගේ "බැද්දේ කුලවමිය" රූපවාහිනී නාටකය හරහා ඔබ විශාල ප්‍රේක්ෂක ආකර්ෂණකයකට නතු වුණා යැයි මා යෝජනා කළොත් ඔබ ඊට කෙතරම් දුරට මා සමඟ එකඟ වනවාද? රූපවාහිනී ප්‍රේක්ෂකයන් එබඳු නිර්මාණයක් වැලඳගන්නා ස්වභාවය අනුව තවමත් ඔවුන්ගේ රසඥතාවය උසස් මට්ටමක පවතින බව අපට පැහැදිළි වනවා නේද?**

**නදී**
ඔබේ ප්‍රශ්නයේ ප්‍රථම අර්ධයට මා පැහැදිලිව සහ නිරවුල්ව කියන්නට කැමතියි, ඔව් සුවිශාල ප්‍රේක්ෂක ප්‍රතිචාර ප්‍රමාණයක් පසුගිය දෙමස තුල පමණක් මට ලැබුණා. ඔවුන් චංචලා නම් ගැමි යුවතියගේ අව්‍යාජ හැඟීම් සමඟ මනා ලෙස බද්ධ වී නිර්මාණය රසවිඳි බව මට දැනුණා. ආනන්ද අබේනායකයන් කවදත් ප්‍රේක්ෂකයාගේ ප්‍රකෘතියට ආමන්ත්‍රණය කළ නිර්මාණකරුවෙක් ලෙසයි මාදැක තිබෙන්නේ. පළමු වරට මා පොහෝදින කෙටි නාට්‍යයකින් රූපවාහිනියට හඳුන්වා දෙනු ලැබුවේ ඔහු විසිනුයි. ඔහු සමඟ කටයුතු කිරීමට ලැබීම ශිල්පියෙකුට ලැබෙන අත් නොහළ යුතු අවස්ථාවක් ලෙසයි මා දකින්නේ. ඔහු එම නිර්මාණය පුරාවටම ඉතාම දක්ෂ ලෙස මා ඇතුළු කණ්ඩායම මෙහෙයවුවා පමණක් නොවේ රූපවාහිනී ප්‍රේක්ෂකයාගේ විඥානය නැවතත් අවධි කළා යැයි මා විශ්වාස කරනවා. ඒ සමස්ථ නිර්මාණය පුරා ඔහුගේ සොඳුරු අනසක පැතිරවීම මගින් උත්පාදනය කළ අමුතුම සෞන්දර්යයක් තබුණා. එය ප්‍රේක්ෂකයා මවිත කළ නිර්මාණයක් ඔවුන් වෙත රැගෙන යැමට තරම් බලවත් කාරණාවක් වුණා.
එසේම විදග්ධ ප්‍රේක්ෂක පිරිසක් කවදත් රූපවාහනිය වටා සිටියා. ඔවුන් එදා පතිරාජ වැනි නිර්මාණකරුවන් සමඟ රැඳී සිටි අචල ප්‍රේක්ෂක ගහනයයි. ඔවුන් කවදත් සුභාවිත කලාව වෙනුවෙන් පෙළගැහෙන අවංක රසික පිරිසක් යැයි මාතුල බලවත් විශ්වාසයක් තිබෙනවා.

**ඕනෑම වෘත්තිකයකු සිය වෘත්තියට ප්‍රවිශ්ට වීමේදීත් ඉන් පසුවත් තම කේෂේත්‍රය පිළබිඳව විධිමත් හැදෑරීමක් සිදුකරනවා. එකී හැදෑරීම වෘත්තීය රංගන ශිල්පියෙකු වීමේදී කෙතරම් දුරට වලංගු වන කාරණයක්ද? සැකෙවින් කීවොත් රංගනය යනු විධිමත්ව හැදෑරිය යුතු විෂයයක් ද නැත්ද යන්න ඔබට සාපේක්ෂව විග්‍රහ කළ හැකිද?**

**නදී**
පැහැදිළිවම රංගනය යනු හැදෑරිය යුතු විෂයය පථයක්. අප එකළ පුරුදුව සිටියේ (අදටත් එම හිතිවිල්ල සමාජය තුල පවතිනවා) රූමත් හෝ කඩවසම් අය තමයි නළු නිළියො කියන්නෙ කියලා. ලස්සන අයෙකු දුටුවාම ආ නළුවෙක් වගේ, නිළියක් වගේ යැයි කීමේ පුරුද්දක් අපේ ජනවහරේ අදටත් තිබෙනවා. නමුත් රංගනය යනු ඉන් එහා ගිය බැරෑරුම් විෂයයක්. මා සිතන විදියට රඟපෑම ඉගෙනීමේදී විශාල පුහුණුවක් අවශ්‍යයි. ශාරීරික අභ්‍යාස, කටහඬ පුහුණුවීම්, නර්තනය, ගායනය මෙන්ම තම ශ්වසනය පාලනය දක්වා ඇතුලත් රංගන අභ්‍යාස සහිත මනා පුහුණුවක් රංගන ශිල්පියෙකුට ඉතා වැදගත් කියා මා විශ්වාස කරනවා. නමුත් රඟපෑම කියන විෂයය ශාස්ත්‍රාලයීයව අධ්‍යයනය කිරීම රංගන ශිල්පියෙකුට කොතරම් ප්‍රයෝජනවත්ද කියන කාරණය ගැන මට ඒ තරං



විශ්වාසයක් නැහැ. එය වඩාත් පැහැදිලි කළොත් රංගනය පිළබිඳව න්‍යායාත්මකව හැදෑරීම හෝ රංගනය විශ්ලේෂණය කරමින් හැදෑරීම නළුවෙකුට හෝ නිළියකට එතරම්ම අවශ්‍ය නැහැ කියන ස්ථාවරයෙයි මා සිටින්නේ. ඇතැම් විට පමණට වඩා න්‍යායාත්මක හැදෑරීමකට ප්‍රවිශ්ට වීම තුල රඟන මොහොතේ පවතින අභිරහස (Mystery) නැතිවී යාහැකියි. කෙසේ වෙතත් නළු නිළියන් රංගනය ප්‍රායෝගික අභ්‍යාස තුලින් හැදෑරීමෙන් සෑහීමකට පත් වී රංගනය න්‍යායාත්මකව විග්‍රහ කිරීම ශාස්ත්‍රඥයන්ට පැවරීම වඩාත් සුදුසුයි කියන තත්ත්වයකයි මා පසුවන්නේ.

ඔබ ඒ ප්‍රශ්නය නැගීමත් සමඟ මට සිහිපත්වෙන්නේ අසහාය රංගන ශිල්පිනී Meryl Streep රඟපෑම හැදෑරීම පිළබදව මතු කළ අදහසක්. මා එය මෑතකදී අන්තර්ජාලය හරහා කියවූ ලිපියක අන්තර්ගත වී තබූ දෙයක්. ඇය වරක් ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රින්ස්ටන් විශ්ව විද්‍යාලයේ රංගනය පිළබිඳව හදාරන ශිෂ්‍යයන්ට දේශනයක් පැවැත්වීමට සහභාගී වුණා. එහිදී ශිෂ්‍යයන් ඇගෙන් නොයෙකුත් ප්‍රශ්න අසා තබුණා. එහිදී එක් සිසුවෙක් ඇගෙන් විමසනවා, රංගනයේදී ඇය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරක්ද කියලා. ඇය ඒ සඳහා මෙබඳු පිළිතුරක් ලබා දී තබුණා.

"මගේ රංගන ක්‍රමවේදය කුමක්දැයි විශ්ලේෂණය කර බැලීමට මා පෙළඹෙන්නේ නැහැ. මන්දයත් එය මා බියට පත් කරන කාරණයක් වන නිසා. මගේ යම් රංගනයක් කපා කොටා ඇතුළත හාරා බැලූ පසු මට නැවතත් කිසිදිනෙක එබඳු රංගනයක් කළ නොහැකි වේදෝයි බියක් මා තුල පවතිනවා. එය මා වත් නොදන්නා අභිරහසක් ලෙසින්ම පැවතීම වඩා හොඳයි."

මා හිතන්නේ මෙරිල් ස්ට්‍රීප් සඳහන් කලා මෙන් රංගනය යන විෂයය න්‍යායාත්මකව ඉගෙන ගන්න අපහසුයි. නමුත් ඉන් මා අදහස් කරන්නේ නැහැ න්‍යායාත්මක හැදෑරීම අවශ්‍යම නැතැයි කියා. ගාමිණී ෆොන්සේකා හෝ ජෝ අබේවික්‍රම හෝ කෞශල්‍යා ප්‍රනාන්දු හෝ නිරූපණය කළ චරිතයක් විග්‍රහ කරමින් ඔවුන් එය ගොඩනැගූ ආකාරය පැහැදිලි කිරීම කළ නොහැකි දෙයක්. එය එක් එක් රංගන ශිල්පියාට ආවේණික වුණ අනන්‍ය වුණ අභිරහසක්. අප වැනි කේෂ්ත්‍රයට මෑතකදී සම්බන්ධ වූ අය කළ යුත්තේ අඛණ්ඩව තනිවම සහ සාමූහිකව රංගන අභ්‍යාස වල නියැලෙමින් තමන්ගේම අභිරහසක් නිර්මාණය කරගැනීමයි.
මා ඉහත සඳහන් කළ දේශනයේදීම තවත් ශිෂ්‍යයෙක් මෙරිල් ස්ට්‍රීප් ගෙන් අහනවා රංගනය හදාරන අය හැටියට ඔවුන් විසින් අධ්‍යයනය කළ යුතු විශේෂ දෙයක් ඇයට නිර්දේශ කළ හැකිද කියා. ඒ සඳහා ඇගේ සෘජු පිළිතුර වී තබුණේ ,
"Learn everything about life, but acting"
යන්නයි.
රඟපෑම ගැන හැර , ජීවිතයේ සෑම සියළු දෙයක්ම හදාරන්න යන අදහසයි ඇය එතැනදී මතුකළේ. අප රඟන්නේ ජීවිතයේ විවිධ අවස්ථා, දුක්වේදනා සහ බලාපොරොත්තු. විවිධාකාර මනුෂ්‍ය ජීවිත පිළබිඳව මිනිස් සංවේදනා පිළබිඳව මෙන්ම විවිධ මිනිසුන් විවිධ අවස්ථා වලදී ප්‍රතිචාර දක්වන ආකාරය පිළබිඳව සූක්ෂම අවබෝධයක් ඇති රංගන කුසලතාවය සහිත ශිල්පියෙකුට හොඳ නිරූපණයක් කළ හැකියි. නමුත් රංගන කුසලතාවය පමණක් ඇති මනුෂ්‍යයන් පිළබිඳව හෝ මානුෂීය සංවේදනා පිළබිඳව හරි අවබෝධයක් නැත්තකුට මිනිස් හැඟීම් පිළබිඳව නොතිත් කුතුහලයක් සානුකම්පාවක් නොමැත්තකුට හොඳ අවංක රංගන ශිල්පියෙකු වන්නට නොහැකියි.
මේ නිසා රංගන ශිල්පීන් ලෙස අප කළ යුත්තේ නන් වැදෑරුම් ජීවිත ගැඹුරින් හැදෑරමයි. නිරන්තරයෙන් ම මිනිස් හැසිරීම් නිරීක්ෂණය කිරීමයි. මනුෂ්‍ය ජීවිත දෙස සානුකම්පිතව බැලීමයි. මිනිසාට බෙහෙවින් ආදරය කිරීමයි.

**නදී ඔබ නිතර තිරයේ දකින්නට නැතත් ප්‍රේක්ෂක මතකය තුල රැඳී සිටින රංගන ශිල්පි නියක්. මෑතකදී ඔබ ව දකින්නට ලැබෙන නිර්මාණ මොනවාද?**

**නදී**
නිසැකවම ඔව්. මා මෑතකදී රංගනයෙන් දායක වූ විසාකේස චන්ද්‍රසේකරන්ගේ "පාංශු" සිනමාපටය තුලින් ඔබට නැවතත් මාදැකගන්නට ඉඩ හසර ලැබේවි. එසේම යහපත් නිර්මාණ තුලින් ප්‍රේක්ෂක ජනතාව ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන යැමේ කාර්යාවලිය තුලදී ඔබට නදී කම්මැල්ලවීරව යළි යළිත් හමුවේවි.

**සන්නස වෙනුවෙන්**
**සාකච්ඡා කර සම්පාදනය කළේ**
**උපේක්ෂා සේනානායක විසිනි.**